# මස් මාංශ අනුභවය මිනිස් දිවිය තුළ ඇතිකරන විපර්යාස පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

කැටවල සමිත හිමි[1]

## ප්‍රවේශය

මිනිසුන් ලෙස ඉපදී බුදුරජාණන් වහන්සේගේ ධර්මය පවතින කාලයක ඉපදීම තුළින් අපි තවත් වාසනාවන්ත වීමු. එම ධර්මය නිවැරදිව හඳුනා නොගැනීමෙන් මිනිසුන් පත්වන ඉරණම ඉතා බියකරුය. බෞද්ධයා ආගම නමැති රාමුවේ සිටිමින් ධර්මය ගැන සෙවීමත්, ත්‍රිපිටකාගත ධර්ම කරුණු නොදැනීමෙන් නිවැරදි යැයි තමන්ගේ සිතින් සිතා අත්තනෝමතික ලෙස ක්‍රියා කරන ආකාරයක් සමාජය දෙස බැලූ කල විද්‍යමාන වේ. එසේ වූ සමාජයක ධර්මය නිවැරදි තැනින් අල්වා නොගැනීමෙන් එය ම තමාට පහර දීමට පටන් ගෙන ඇත. එවැනි වූ බොහෝ ප්‍රශ්නඅතර සමාජයක් ලෙස මුළු රට ම විශාල අගාධයකට ඇද දමා ඇති ප්‍රධානතම ප්‍රශ්නයක් ලෙස මස් මාංශ අනුභවය පිළිබඳව සඳහන් කළ හැකිය. අද ඒ පිළිබඳව දරන මතය ධර්මය නමැති සර්පයා වැරදි ලෙස අල්වා ගැනීමකි. දැන් එම සර්පයා පහර පිට පහර දෙමින්, මුළු සමාජය ම තමාට නතු කරගැනීමේ ප්‍රයත්නයට එක් වී හමාරය. එයින් සමාජය ගලවා ගැනීමට නම් සර්පයාගේ නිවැරදි තැනින්ම අල්වා ගත යුතුය.

බුදුන් වහන්සේ ජීවමාන කාලයේ දී සිටම මස් මාංශ සම්බන්ධයෙන් මැදුම් පිළිවෙතක් අනුගමනය කළ බව විනය පිටකය විමසීමේ දී පෙනී යන කරුණකි. චුල්ලවග්ගපාළි සංඝභේදක්ඛන්ධකයට අනුව දේවදත්ත හිමියන් සංඝයා භේද කිරීම අරමුණු කොට ඉල්ලා සිටි සප්ත වරයෙන් එකක් වනුයේ ජීවිතාන්තය තෙක් භික්ෂූන් මස් මාංශයෙන් වැළකිය යුතුයි යන්නයි. එනමුත් ඊට අනුමැතිය දීමෙන් බුදුන් වහන්සේ වැළකුණහ. එයට හේතු වූයේ ඒ වන විට ද පනවා තිබූ ත්‍රිකෝටික පාරිශුද්ධ මාංශයපිළිබඳව වූ විනය නීතියයි.

- තමා උදෙසා මරණ ලදැයි නොදුටු
- තමා උදෙසා මරණ ලදැයි නොඇසූ
- තමා උදෙසා මරණ ලදැයි සැක නොකළමාංශය වැළඳීම කැප ය.

එය මජ්ඣිම නිකායට්ඨ කථාව වන පපඤ්චසූදනී අටුවාවෙහිසඳහන් කොට ඇත්තේ මාංශ අනුභවයේදීඑය ශාඛමය ආහාරයක් යන චේතනාවෙන් ගත යුතුය.

---

[1] උපාධි අපේක්ෂක, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, theras702@gmail.com

එසේම අභිධර්මයට අනුව මැරුණු සතෙකුගේ හෙවත් මාංශ කොටස්වල අයත් වන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූත කොටස් වේ. එළවළු හා පළතුරුවල අඩංගු වන්නේ ද එම සතර මහා භූත කොටස් ය. මැරුණු සත්ත්වයෙකු තුළ නාම ධර්ම නොමැත. ඇත්තේ රූප ධර්මයන් පමණි. එම නිසා මාංශය හා එළවළු, පළතුරු සංයුතිය අතින් එක හා සමානය. එබැවින් මාංශ අනුභවය කිරීම තුළින් පවක් සිදු නොවේ.මේ අනුව පව සිදු වන්නේ ප්‍රාණය තොර කරන්නාට ය. එසේ ප්‍රාණය තොර වූ සතෙකු අනුභව කරන්නාහට පවක් සිදු නොවේ.

මාංශ ප්‍රශ්නය පිළිබඳ තවත් විමසීමේ දී බුදු රජාණන් වහන්සේ නොවැළඳිය යුතු මාංශ දහයක් මහාවග්ගපාළි භේසජ්ජක්ඛන්ධකයේ දී දේශනා කළ සේක. එයින් අදහස් වන්නේ ත්‍රිකෝටික පාරිශුද්ධියට යටත් වුවත් මෙම දස මාංශය අනුභවයෙන් වැළකිය යුතු බවයි. එනම්; මිනී මස්, ඇත් මස්, අශ්ව මස්, බලු මස්, සර්ප මස්, සිංහ මස්, ව්‍යාඝ්‍ර මස්, දිවි මස්, වලස් මස්, කරබානා වලස් මස් ය. මෙම මාංශ වැළඳීම භික්ෂුවකට දුකුලා ඇවැත් සිදුවන බව එහිම දේශිතය.

මෙය මස් මාංශය කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය වූ නමුදු මෙම සියලු කාරණා රහතන් වහන්සේලා සඳහා අනුදැන වදාරා ඇත. එයට හේතුව මස් මාංශ අනුභවයේ දී පපඤ්චසූදනී අටුවාවෙහිජීවක සූත්‍ර වණ්ණනාවේ සඳහන් ආකාරයට එළවළු පළතුරු වැනි ශාඛමය ආහාරයක් යන සංජානනයෙන් මාංශ අනුභවය කැප යැයි දේශිත ය. පෘථග්ජනයන් සඳහා එය සාර්ථක වූවක් නොවෙන බැවිනි.

මස් මාංශයෙන් වැළකිය යුත්තේ කුමන පදනමක් යටතේ දැයි සිතා බැලීම යුක්තායුක්ත වේ. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව මෙලොව සත්ත්වයන් ප්‍රථමයෙන් පහළ වන්නේ ආභස්සර බ්‍රහ්ම මණ්ඩලයේ සිට පැමිණීමෙනි. "එහි දී එක්තරා ලෝල ස්වභාව ඇති සත්ත්වයෙක් ඇඟිල්ලෙන් රස පොළොව ගෙන දිව ගා බැලීය. එය ඔහුට ප්‍රිය විය. තෘෂ්ණාව ඔහු සිතට බැස ගත්තේ ය. එය දුටු අනෙක් සත්ත්වයෝ ද එසේ රස පොළොව අනුභව කිරීම සිදු කළෝය. එහි දී තෘෂ්ණාව නිසා ස්වයම් ප්‍රභාව අතුරුදහන් විය." මේ නයින් පුද්ගල ශරීරයෙන් නිකුත් වන ශක්තියක් ඇති බව පැහැදිලි වේ. එම ශක්තිය, සිත තුළ ලෝභ, ද්වේශ, මෝහ නම් වූ අකුසල මූලයන් වර්ධනය වීම නිසා හීන භාවයට පත් වූ බව එම දේශනාවෙන් විශද වේ. එසේ වූ ශාරීරික රශ්මි ධාරාව අද බටහිර විද්‍යාවෙAura යන නමින් හඳුන්වනු ලබයි. ඒ පිළිබඳව විශාල ගවේෂණ රාශියක් සිදු වෙමින් පවතින අතර බොහෝ පිරිසක් මෙමගින් ශක්තීන් ආරෝපණය කර ගැනීමෙහි ද ලොව පුරා නිරත වෙති. එම රශ්මි ධාරාව මගින් පුද්ගල ශරීරයට අදෘශ්‍යමාන ආත්මයන්ගෙන් එල්ල වන්නා වූ බලපෑම් අවම කරයි. කෙනෙකු මස් මාංශ අනුභව

කරනු ලබයි ද, අකුසල් සහගත සිතින් වාසය කරයි ද, මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි ද, ඔහුගේ මෙම ශාරීරික රශ්මි ධාරාව තුනී වී සිදුරු හට ගනියි. එමගින් විවිධ වූ අමනුෂ්‍යයන් මිනිස් ශරීරගත වේ. දීඝ නිකායාගත ආටානාටිය සූත්‍රයේ දේශිතාකාරයට එසේ ශරීරගත වීම සිදුවනුයේ ගවයන්, සිව්පා සතුන්, කුමර කුමරියන්, ස්ත්‍රී පුරුෂයන්ගේය. ශරීර ගත වන අමනුෂ්‍යයන් විසින් ඒ සත්ත්වයාගේශරීරයෝ ද, මානසිකයෝ ද පාලනය කරනු ලැබේ. තත් ආකාරයට පුද්ගලයෙකුට අමනුෂ්‍යයෙක් ශරීරගත වී ද, ඔහු පිටතට පැමිණි අවස්ථාවල පුද්ගලයාගේ පියවි සිහිය නැති වී යයි.

චතුභාණවාරපාළි අට්ඨකථාවෙහි ආටානාටිය සූත්‍ර වර්ණනාවෙ එය මඟහැරවීමට නම් පිරිත් දේශනා සිදු කළ යුතු බවත් දේශක භික්ෂුව කිසිදු ලාභාපේක්ෂාවකින් තොර සිතින් විය යුතු සේම මස් මාංශයෙන් ද, පිටි ආහාරයෙන් ද වැළකිය යුතු බවත්දක්වා ඇත. එසේම සොහොනෙහි නොවිසිය යුතුය.  කුමක් හෙයින්ද යත් අමනුෂ්‍යයෝ (ශාරීරික රශ්මි ධාරාවේ) සිදුරු තැන් ලබන බැවිනි. මේ අනුව අමනුෂ්‍ය දෝෂ ගිහි පාර්ශවයට පමණක් නොව පැවිද්දන් සඳහා ද බලපානු ලබයි.

යක්ෂයෙකු ශරීරගත වූ විට ඔහු විසින් මිනිසුන් වෙත කරන බලපෑම ආටානාටිය සූත්‍රයේ දී"යක් තෙමේ මා අල්ලා ගනී. යක් තෙමේ මට ආවේශ වෙයි. යක් තෙමේ මා පෙළයි. මේ යක් තෙමේ මා වෙසෙසින් පෙළයි. යක් තෙමේ මට හිංසා කරයි. මේ යක් තෙමේ මා වෙහෙසයි. යක් තෙමේ මා නොමුදයි". යනුවෙන් දක්වා ඇත.

එය සුමංගල විලාසිනී අටුවාවේ මෙසේ විස්තර කෙරේ.'ගණ්හාති එහි සිරුරට ආවේශ වෙයි. ආවිසති එයට සමාන වචනයකි. හෙඨෙති හටගත් රෝග වැඩි කරමින් බාධා කරයි. විහෙඨෙති එයට සමාන පදයකි. හිංසති සිරුරේ මස් ලේ වියලමින් දුකට පමුණුවයි. විහිංසති එයටම සමාන වචනයකි. නමුඤ්චති අපස්මාරය ඇත්තෙක්ම මුදන්නට නොකැමති වෙයි යනුයි.'මේ ආකාරයට අමනුෂ්‍යයෝ ශරීරගතව පිළිකා, අංශභාග, ගර්භාශ්‍රිත රෝග, වකුගඩු දියවීම්, සුව නොවන දද, කුෂ්ඨ, තුවාල, හෘද රෝග, උදර වේදනා, හිසේ කැක්කුම්, අත පයෙහි වේදනා, කොන්දේ අමාරු ආදී රෝගයන් ඇතිකරති.

මෙම රෝගයන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ගත්ත ද සුව නොවේ. අමනුෂ්‍ය ආත්මය ශරීරය තුළ සිටිමින් එම රෝග උත්සන්න කරයි. වේදනා නාශක තුළින් වේදනාව සමනය කිරීම වෛද්‍යවරුන් සිදු කෙරුව ද, රෝගී තත්ත්වය සුව නොවේ. එය අදෘශ්‍යමාන ආත්මය ඉවත් වන තුරුම ශරීර ගතව පවතී.

මහාවග්ග පාළියේ භේසජ්ජක්ඛන්ධකයෙහි මෙසේ සඳහන් වේ. එකල්හි එක්තරා මහණකුට අමනුෂ්‍යාබාධයෙක් වේ. ආචාර්ය උපාධ්‍යයෝ ඔහුට උවටැන් කරන්නෝ නීරෝග කරන්නට නොහැකි වූහ. ඒ මහණ තෙමේ ඌරන් මරණ තැනකට ගොස් අමු මස් කෑයේය. අමු ලේ ද බීයේ ය. (ආවිශ්ට වූ අමනුෂ්‍යයා මස් ලේ කා බී ගියේ ය) ඔහුගේ ඒ අමනුෂ්‍යාබාධය සන්සිඳුණේ ය. භාග්‍යවතුන් වහන්සේ ට මෙය සැල කළහ. 'මහණෙනි, අමනුෂ්‍යයන් නිසා හටගත් රෝගයෙහි අමු මස්, අමු ලේ අනුදනිමි' යි.'මේ අනුව භික්ෂූන් වහන්සේලා හට ද අමනුෂ්‍ය බලපෑම් එල්ල වන බව පැහැදිලි ය. ගිහි පුද්ගලයින් පිළිබඳ කියනුම කවරේ ද?

## ප්‍රතිඵලය

සිය දහස් ගණනින් අද ලක්දිව තුළ පමණක් අමනුෂ්‍යාබාධ නිසා ඇතිවන රෝගවලින් පීඩා විඳින මිනිසුන් ගලවා ගැනීමත්, නිර්මාංශික සමාජයක් තුළ නිරෝගී පුද්ගලයන් බිහි කිරීම හා බුදු දහම සුරකින සිල්වත් බෞද්ධයන් පිරිසක් වෙසෙන රටක් ගොඩනැගීමත් මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථයයි.

## නිගමනය

සාම්ප්‍රදායික මතයන් පසෙක ලා නිවැරදිව මස් මාංශ අනුභවයෙන් වැළකීමෙන් පුද්ගල ජීවිතය වඩා යහපත් හා සාමකාමී ලෙස පවත්වාගෙන යාම සඳහාත්, මස් මාංශ අනුභවය පවක් ලෙස දකින මිථ්‍යා දෘෂ්ටිය ඉවත් කොට ඒ සඳහා සහේතුකව අදෘෂ්‍යමාන ආත්මයන් විසින් ඇතිකරන්නා වූ නා නා විධ රෝගයන්ගෙන් තොරව සැහැල්ලු දිවියක් මිනිසාට උරුම කර ගැනීමටත් උක්ත කරුණුවලින් සමන් විත මෙම පර්යේෂණය උපකාරී කර ගත හැකිය.

ප්‍රමුඛ පද : ත්‍රිපිටකය, මස් මාංශ, මිනිස් දිවිය, රෝග නිවාරණය

## ආශ්‍රිත ග්‍රන්ථ

*චතුභාණවාරපාළි අට්ඨකතා.* (2006). බු. ජ. ත්‍රි., නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*චුල්ලවග්ගපාළි 02.* (2006). බු.ජ.ත්‍රි., නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය.* (2006) බු.ජ.ත්‍රි., නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකාය.* (2006). බු.ජ.ත්‍රි., නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවග්ගපාළි 02.* (2006). බු.ජ.ත්‍රි., නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.